ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2016 දෙසැම්බර් 23 යොමු අංකය: 1617-021

දයාබර දෙමව්පියන් වෙත,

**වසර අවසාන පිරිත් පිංකම 2016.12.31**

ඩුබායි දහම් පාසල විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන වසර අවසාන සර්ව රාත්‍රික පිරිත් පිංකම සහ පසුදින පැවැත්වෙන සංඝගත දක්ෂිණාව පහත සඳහන් හේතූන් නිසා අවලංගු කිරීමට සිදුවී ඇති බව කනගාටුවෙන් දැනුම් දෙමු.

- කොන්සල් ජනරාල් කාර්යාලය පරිශ්‍රය අවට සෑම සිකුරාදා දිනකම පවතින වාහන තදබදය (double parking, pavement parking, parking in front of the entrance, etc.) පිළිබඳව අවට ප්‍රදේශවාසීන් විසින් අදාල බලධාරීන් වෙත පැමිණිලි කොට තිබීම.
- කොන්සල් ජනරාල් කාර්යාලයේ රාජකාරි කටයුතු වලට අමතරව එම භූමිය ආගමික හා සංස්කෘතික කටයුතු සඳහා නිතර යොදාගැනීම.
- එම අවස්ථාවන්හිදී නොයෙකුත් ආකාරයේ ප්‍රචාරණ කටයුතු සඳහා කොන්සල් ජනරාල් කාර්යාලය අවට පරිසරය යොදා ගැනීම.
- එම සංස්කෘතික හා ආගමික වැඩසටහන් පැවැත්වෙන අවස්ථාවන් හි දී අවට ප්‍රදේශවාසීන්ට බාධා පැමිණෙන ආකාරයට කණ්ඩායම් වශයෙන් එම නිවෙස් අවට කාලය ගත කිරීම.

ඉහත කරුණු හේතු කොටගෙන ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය සඳහා ලබා දී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්තුවට අනුව, වහාම එම කටයුතු නතර කරන ලෙස දේපල හිමිකරු විසින් කොන්සල් ජනරාල් තුමන් වෙත දුරකතනයෙන් සහ ලිඛිතව දන්වා ඇත. **මේ අනුව ඉදිරියේදී අප දහම් පාසල මෙම ස්ථානයේ පවත්වාගෙන යාම අවිනිශ්චිත තත්වයක පවතී.** මෙම ලිපිය සහ අදාල කරුණු සම්බන්ධයෙන් දේපල හිමිකරු සමග සාකච්චාවක් ගරු කොන්සල් ජනරාල් තුමා ඉදිරි සතිය තුල පැවැත්වීමට කටයුතු යොදමින් පවතී. එම සාකච්චාවෙන් අනතුරුව දහම් පාසල නැවත පවත්වන දිනය දැනුම්දෙනු ඇත.

මෙම තත්වය යටතේ 2016 දෙසැම්බර් 31දින රාත්‍රියේ පැවැත්වීමට නියමිත වූ සර්ව රාත්‍රික පිරිත් පිංකම සහ ජනවාරි 01 වන දින හීල් දානය සහ දහවල් දානය සඳහා එක්රැස් කරන ලද ආහාර සහ ද්‍රව්‍ය අවශ්‍ය නොවන බව කරුණාවෙන් සලකන්න. මෙම උතුම් පිංකම පැවැත්වීමට විකල්ප ක්‍රියාමාර්ගයක් ලෙස පිරිත් පිංකම සඳහා ලංකාවෙන් වැඩමකිරීමට නියමිත ස්වාමින් වහන්සේලා ඔබගේ නිවසට වැඩමවා සෙත් පිරිත් හෝ වරු පිරිත් සජ්ඣායනා කරවාගැනීමට හෝ ධර්ම දේශනා පවත්වා ගැනීමටත් 2017 වසරේ ජනවාරි 01 දින හීල් දානය සහ දහවල් දානය පිළිගැන්වීමටත් ඔබට අවස්ථාව ඇත. ඒ සඳහා වැඩි විස්තර සහ සම්බන්ධීකරණයට **සුරංගනී 0529261576** අමතන්න:

ස්තුතියි,

සංවිධායක කමිටුව

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org